# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.10.24 පැය 0625 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1934/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**</u>

**01. නීති විරෝධී පිරමීඩ යෝජනා ක්‍රමයක් පවත්වාගෙන ගිය සැකකරුවන් 07 දෙනෙකු අත්අඩංගුවට - මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය.**

පොලිස්පතිතුමා වෙත ලැබී තිබූ තොරතුරකට අනුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරින් කණ්ඩායමක් විසින් සිදු කරන ලද විමර්ශනයකින් පසු පිරමීඩාකාර යෝජනාක්‍රමයක් පවත්වාගෙන යාම, ප්‍රවර්ධනය කිරීම හා එම යෝජනාක්‍රමය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සැකකරුවන් 07 දෙනෙකු 2025.10.23 වන දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 40 ත් 64 ත් අතර වයස්වල පසුවන රත්මලාන, පන්නිපිටිය, ගල්නෑව, හෝකන්දර, පේරාදෙනිය හා කොළඹ 04 ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ මුදල් සංසරණය කිරීමට සම්බන්ධ සැකකාරියක් අත්අඩංගුවට - නීතිවිරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය.**

2025.10.23 වන දින නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් විමර්ශන සිදු කර විදේශ රටවල සැඟව සිටින සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් දෙදෙනෙකුට අයත් මුදල් සංසරණය කිරීමේ අරමුණින් මෙරට පුද්ගලික බැංකු දෙකක ගිණුම් දෙකක් ආරම්භ කර එම මුදල් සංසරණය කරමින් මත්ද්‍රව්‍ය ජාවරමට සම්බන්ධ වූ සැකකාරියක් නීතිවිරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 28 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දිය අනතුරකින් විදේශීය ජාතිකයින් සිව්දෙනෙකු බේරා ගැනීම - පොලිස් ජීවිතාරක්ෂක ඒකකකය මිරිස්ස.

2025.10.23 වන දින දහවල් කාලයේදී කොටවිල පොලිස් වසමේ මිරිස්ස වෙරළ තීරයේ දියනෑමට ගිය විදෙස් ජාතික පුද්ගලයින් දෙදෙනෙකු හා කාන්තාවන් දෙදෙනෙකු දිය වැලකට හසුවී මුහුදට ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත උප පොලිස් පරීක්ෂක මෙන්ඩිස්, පොලිස් සැරයන් 59416 අජන්ත, පොලිස් සැරයන් 60674 ප්‍රියදර්ශන, පොලිස් කොස්තාපල් 96986 දිසානායක, පොලිස් කොස්තාපල් 104360 දේශාන් හා පොලිස් කොස්තාපල් 105268 කහවත්ත යන නිලධාරින් විසින් ඔවුන් සිව්දෙනා බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබා දී ඇත.

**මෙලෙස අනතුරට පත්ව ඇත්තේ අවුරුදු 31 හා 38 වයස්වල පසුවන විදෙස් ජාතික පුද්ගලයින් දෙදෙනෙකු හා අවුරුදු 24 හා 28 වයස්වල පසුවන විදෙස් ජාතික කාන්තාවන් දෙදෙනෙකු වේ.**

එම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

## 04. මෘත ශරීරයක් හමුවීම - කොළඹ වරාය පොලිස් වසම.

2025.10.23 වන දින දහවල් කාලයේ කොළඹ වරාය පොලිස් වසමේ කොළඹ වරාය අදානි පර්යන්තයේ ජැටිය ආසන්නයේ මුහුදේ මළ සිරුරක් ඇති බවට ලද පණිවිඩයක් මත කොළඹ වරාය පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරුවී නොමැත.**

මරණකරු උස, අඩි 05 ක් පමණ වන පුද්ගලයෙකි. කොණ්ඩය මදක් වැවී ඇත. මෘත ශරීරය නරක්වී හඳුනාගත නොහැකි තත්වයේ ඇති අතර නිල් පැහැති ඩෙනිම් කලිසමක් හැඳ සිටී. මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

## 05. මාරක රිය අනතුරක් - ලුණුගම්වෙහෙර පොලිස් වසම.

2025.10.23 වන දින රාත්‍රී කාලයේ ලුණුගම්වෙහෙර පොලිස් වසමේ මොණරාගල මාතර මාර්ගයේ කිලෝමීටර් 21 කණුව ආසන්නයේදී ලුණුගම්වෙහෙර දෙස සිට තණමල්විල දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන් කල පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයා ලුණුගම්වෙහෙර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 64 ක් වූ තිස්සමහාරාම ප්‍රදේශයේ පදිංචි කරුවෙකි.**

මෘත ශරීරය ලුණුගම්වෙහෙර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සිදු කල කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ලුණුගම්වෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - වාලච්චේන පොලිස් වසම.

2025.10.23 වන දින සවස් කාලයේ වාලච්චේන පොලිස් වසමේ මඩකලපුව පොළොන්නරුව මාර්ගයේ වාහනේරි ප්‍රදේශයේදී වලෙච්චේන දෙස සිට පොළොන්නරුව දෙසට ධාවනය වූ වෑන් රථයක් එම දිසාවටම ඉදිරියෙන් ධාවනය වූ බවුසර් රථයකට ඉස්සර කිරීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ටිපර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් වෑන් රථයේ රියදුරු ඇතුළු එකම පවුලේ පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු හා කාන්තාවන් හය දෙනෙකු තුවාල ලබා වාලච්චේන රෝහලට ඇතුලත්කර වැඩිදුර ප්‍රතිකාර සඳහා මඩකලපුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 74 ක් වූ වැලිකන්ද ප්‍රදේශයේ පදිංචි කරුවෙකි.**

මෘත ශරීරය මඩකලපුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ටිපර් රථයේ රියදුරුද තුවාල ලබා වාලච්චේන රොහලට ඇතුලත්ව ප්‍රතිකාර ලබයි. වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**